285728

සියලු ම හිමිකම් ඇවිරිණි] முழுப் பதிப்புரிமையுடையது [All Rights Reserved]

නව නිර්දේශයපුතිය பாடத்திட்டம்/New Syllabus

NEW 21 S III

Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

සිංහල භාෂාව හා සාහිත්‍යය III சிங்களமொழியும் இலக்கியமும் III Sinhala Language and Literature III	පැය දෙකයි இரண்டு மணித்தியாலம் Two hours

සිංහල භාෂාව හා සාහිත්‍යය III

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර සපයන්න.

* **1, 2, 3, 4** ප්‍රශ්නවලටත්, **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**යි.

1. (i) පිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නො ලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) 'ගුත්තිල කාව්‍යය' රචනා කරන ලද්දේ කවර සාහිත්‍ය යුගයේ ද?
(ආ) 'ගුත්තිල කාව්‍යයේ' රචකයා නම් කරන්න.

(ii) (අ) සිංහල ජන ජීවිතය පිළිබඳ ඉංග්‍රීසි භාෂාවෙන් රචිත 'විලේජ් ඉන් ද ජංගල්' කෘතියේ කතුවරයා නම් කරන්න.
(ආ) 'බැද්දේගම' හැර ඒ. පී. ගුණරත්න මහතා විසින් පරිවර්තනය කරන ලද වෙනත් නවකතාවක් නම් කරන්න.

(iii) (අ) 'ගංගාවේ සංගීතය' පැදිපෙළ අයත් වන්නේ කවර යුගයකට ද?
(ආ) 'කුණාටුව', 'එකෝමත් එක රටක', 'සංවාදය' යන කාව්‍ය ග්‍රන්ථවල රචකයා කවරෙක් ද?

(iv) (අ) 'පන්සිය පනස් ජාතක පොත' සඳහා ශිලාශ්‍රය කොටගත් ග්‍රන්ථය නම් කරන්න.
(ආ) මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම සඳහා රචනා කරන ලද ජාතක කථාව කුමක් ද?

(v) (අ) 'සිංහබාහු' නාට්‍යය හැර මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසින් රචිත වෙනත් නාට්‍ය **දෙකක්** ලියන්න.
(ආ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ස්වයං ලිඛිත චරිතාපදානය කවර නමකින් හැඳින්වේ ද?

(vi) (අ) 'හංස සන්දේශය', 'ලෝවැඩ සඟරාව', 'කවි උකුණු මිණිමල' යන ග්‍රන්ථවල කතුවරයා නම් කරන්න.
(ආ) 'හංස සන්දේශය' ලියන ලද සාහිත්‍ය යුගය දක්වන්න.

(vii) (අ) සේ. ජයසිලක මහතා විසින් රචනා කරන ලද කෙටිකතා සංග්‍රහ **දෙකක** නම් ලියන්න.
(ආ) 'දියමන්ති මාලය' කෙටිකතාවේ ප්‍රධාන චරිතය කුමක් ද?

(viii) (අ) දැනට මෙරට හමු වී ඇති පැරණිතම සිංහල කෘතිය කුමක් ද?
(ආ) එම කෘතියේ රචකයා නම් කරන්න.

(ix) පහත සඳහන් කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

සිය පින් සිරින් සරු
දෙසිස් උකුණෙන් විසිතුරු

(අ) .....

(ආ) .....

(x) (අ) 'කවිමිණ', 'කවිමුතු', 'ළමා කවි කලඹ' යන කෘතිවල රචකයා නම් කරන්න.
(ආ) සිනිඳු මොළොක් බව මලෙහි
පිරිසිදු බව පිනි හිඳෙහි

යන පද්‍යය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "මචි, එදා මයාව හම්බු වෙලා කරා බස් කරලා ගිය දවසෙ ඉඳන් අද වන තුරු මම චින්ද කරදර හිරිහැර අනන්තයි. අප්‍රමාණයි. ඉතින් ඒ මක්කෝම මං චින්දෙ මයා හින්දා"

(අ) මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

[දෙවැනි පිටුව බලන්න.